ජගත් ජේ එදිරිසිංහ

# කඩු

10

තිසර සූරියබණ්ඩාර පිටව ගියේ මදාරා ගේ සිත ගිණි තබමින් ය. මේතාක් කාලයක් නිවී යටපත් වී තිබූ ගිනි කන්දක් අනපේක්ෂිත මොහොතක පුපුරා ගියා සේ ආයාසයෙන් යටපත් කර දමා තිබූ අතීතයේ අපුල සිහිපත් කර දෙන්නට ඔහු නැවත පැමිණ ඇත. අතිශය දුර්වල අත්තිවාරමක් මත ගොඩ නගමින් තිබෙන තම ජීවිතය එක මොහොතකින් බිඳ වැටී ඇති සෙයක් ඇයට දැනුණි. යකඩ ගැහැණියක ලෙස දැඩි සිතින් ඉන්නට කෙතරම් උත්සාහ කළ ද තමා ඉතාම සාමාන්‍ය ගැහැණියක පමණක් නොවේද යන සත්‍යය බොහෝ කලකට පසු අද ඇයට පසක් විය.

තව දුරටත් එකලස් කරගත් සිතින් කාර්යාලයේ වැඩ කළ නොහැකි බවක් මදාරාට දැනුණි. ඇය මේසයට හිස තබා ගත්තා ය. සිහින් කඳුලක් ඇගේ ඇසින් ගලා විත් මේසයේ විදුරුව මතට වැටුණි.

"මදාරා.." සිසිර කුලසේකර ගේ ගැඹුරු කටහඬ මදාරාට ඇසුණි. ඇය හිස නොඔසවා ම ලේන්සුවෙන් කඳුළු පිසදා ගත්තා ය. ".. මොකද වුණේ..?" ඔහු අසනු ඇයට ඇසුණි. උස් හඬින් කෙරුණ සියලු කතා බහ නිසැකව ම ඔහුට ඇසෙන්නට ඇත.

ඇය හිස ඔසවා සිය ප්‍රධානියා දෙස බැලුවා ය.

"ඔයාගෙ පුද්ගලික ප්‍රශ්නයක් නම් කියන්න අවශ්‍ය නැහැ." තිසර කීවේ ය.

මදාරා මේසය මත වූ අත්බෑගය කොණහමින් මඳ වේලාවක් ගත කළා ය. "මට.. මට වරුවක නිවාඩුවක් දෙන්න පුලුවන් ද මිස්ටර් කුලසේකර..?" ඇය බොහෝ ආයාසයෙන් කටහඬ අවදි කළා ය.

"ප්‍රශ්නයක් නම් හිත කලබල කරගන්න එපා.." ඔහුගේ කරුණාවන්ත වදන් මදාරාට සැනසීමක් ගෙන ආවේ ය. ".. පරිස්සමින් යන්න.. මං පියසේනට කියන්නං ඔයාව ඔෆිස් වෙහිකල් එකෙන් ගෙදරට බස්සන්න කියල .."

ඇය ඔහු දෙස කෘතවේදී බැල්මක් හෙලුවා ය. " එපා මිස්ටර් කුලසේකර... මං බස් එකේ යන්නං.." ඇයට අවශ්‍යව තිබුණේ කෙලින්ම ගොස් විදුල හමුවන්නට ය. සිදුවූ සිදුවීම ඔහු හා පවසා සිත සැහැල්ලු කරගන්නට ය. සිත පුරවා වාං දමන වේදනාව සමනය කරගන්නටය.




"කමක් නැහැ.. ඔෆිස් වාහනෙන් යන්න.. මං පියසේනට කියන්නං ඔයාට අවශ්‍ය තැනකට ගෙනිහින් ඩ්‍රොප් කරන්න කියලා.. මගෙ හිතට හරි නැහැ ඔයා ඔය විදිහට බස් එකේ යන එකට.." සිසිර කීවේ තමාගේ සිත කියෙව්වා සේ යයි මදාරාට සිතුණි.

"If things go wrong, don't go with them. Try to be strong" ඔහු කීවේ කාමරයෙන් පිටව යන අතර ය

000000

"තිසර සූරියබණ්ඩාර මෝඩයෙක් වගේ කෑ ගැහුවට එයාට කරන්න පුළුවන් දෙයක් මෙතන නෑ.." විදුල කියන්නේ මදාරා සැනසීම සඳහා ම නොවේ. තමාගේ තිරනාටකයේ කොතැනක හෝ තිසර සූරියබණ්ඩාර හඳුනාගත හැකි සඳහනක් හෝ නොමැති හෙයින් නීත්‍යානුකූලව කළ හැකි අභියෝගයක් නොමැති බව ඔහු දැන සිටියේ ය.

"කවුරු හරි මිනිහ නොසෑහෙන්න බය කරල තියෙනවා.. නැත්නම් මිනිහ මොකටද බලෙන්ම තොප්පිය දාගන්න හදන්නෙ.. පිස්සෙක්නෙ.."

"එයාට බයවෙන්න ඕනෙ තරම් හේතු කාරණා තියෙනවනෙ සර්.. " මදාරා වාහනයේ ඉදිරි විදුරුව තුළින් ඈත බලාගත්වන ම කීවා ය. වෙරළාසන්න පාර ඔස්සේ රිය පදවාගෙන ආ විදුල මුහුදට මුහුණ ලා වාහනය නැවැත්තුවේ මදාරා හා නිස්කලංකව කතා කරන්නට එතැන සුදුසු යයි සිතූ නිසා ය. නගරයේ කළහයෙන් මඳක් මිදෙන්නට මෙය සුදුසුම තැනක් යයි ඔහුට මොහොතකට සිතුණි.

"ඔයා කලබල වෙන්න අවශ්‍ය නෑ මදාරා.. මං කවදාවත් ඔයාව හරි වෙනත් කෙනෙක්ව හරි අමාරුවේ දාන්න නිර්මාණ කරන්නෙ නැහැ.. මට අවශ්‍ය පොදු සාකච්ඡාවක් කරන්න මිසක් පුද්ගලයින් වෙන් කරලා අරගෙන පහර ගහන්න නෙවෙයි.. මේක සිනමා නිර්මාණයක්.. ඩොකියුමන්ට්‍රියක් නෙවෙයි.. මං කරන්නෙ මං දන්න සිදුවීම් කීපයක් මුල් කර ගනිමින් යම් අලුත් කතාවක් නිර්මාණය කිරීම.. ඒ නිර්මාණය තුළින් මේ ප්‍රශ්න ගැන සමාජයේ සාකච්ඡාවක් ඇති කිරීම.. මේ කෙරෙහි සමාජ අවධානය යොමු කිරීම.."

මදාරා කිසිවක් නොකියා මුහුදු වෙරළ දිගේ ඇවිදිමින් සිටි තරුණියන් සමූහය දෙස බලා සිටියා ය. ඔවුන්ගේ කෙළි ලොල් විලාසය ඇගේ සිත් ගත්තේ ය. මේ තරම් කෙළිලොල් අතීතයක් කිසි දිනෙක තමාට නොතිබුණා නොවේදැයි ඒ සමගම ඇයට සිතුණි. එසේ වූයේ කාගේ වරදින්දැයි සිතන්නට ඇය නොවෙහෙසුනා ය. ඒ අතීතය නැවත ආවර්ජනය කිරීමෙන් සිදුවන සෙතක් නැත. ඇය සුසුමක් හෙළා විදුල දෙස හැරී බැලුවා ය.

"මතුපිටෙන් හොඳ මිනිහෙක් වගේ පෙනුණට තිසර අන්තිම පහත් මිනිහෙක්.. එයාට කරන්න බැරි පහත් වැඩක් නැහැ.. එයාගෙ උගත් කමින් ලැබෙන කඩතුරාවට මුවා වෙලා, එයාගෙ සිවිල් බලයට මුවා වෙලා, සමාජ තරාතිරම අනුව කෙනෙකුට හිතන්නවත් බැරි පහත් වැඩ එයාට කරන්න පුලුවන් සර්.. මට බයයි මේ වැඩ වලින් සර්ට කරදරයක් වෙයි කියල .. අපි හැමෝම දන්නවනේ සර් මෙයිට ඉස්සෙල්ලත් නොයෙකුත් කරදර වලට මුහුණ දුන්න බව.. ආයෙත් වතාවක් ඒ වගේ දේ බලහත්කාරයෙන් ළං කර ගන්නෙ මොකටද කියල මට හිතෙනවා සර්.."

"මදාරා කියන දේ මට තේරෙනවා.. බය වෙනවා නම් දැන්ම බය වෙන එකේ තේරුමක් නැහැ.. " ඔහු සිනාසුණේ ය. ".. මොකද කිසිම නිෂ්පාදකයෙක් කැමති නැහැ මේ චිත්‍රපටිය කරන්න සල්ලි දාන්න.. මට තනියම මේක කරන්න වත්කමකුත් නැහැ.. ඒ නිසා මේක යථාර්ථයක් කරගන්න කවදා කොහොම පුළුවන් වෙයිද කියලා මම වත් දන්නෙ නැහැ.."

"අපරාදෙ.." මදාරා කීවා ය.

"අපරාදෙ තමයි..." විදුල තමා වාඩි ව සිටි පැත්තේ ජනේල විදුරුව පහත් කළේ ය. ඒ හරහා ඇදී ආ අකීකරු සුළඟ විදුල ගේ මුහුණේ ගැටී එසැණින් මදාරා ගේ කෙස් කළඹ විසුරුවා දැමුවේ ය. "..මං අන්තිම චිත්‍රපටිය කළ කාලයත් අදත් අතර සමාජය හරිම වෙනස් වෙලා මදාරා.. මට හිතාගන්නවත් බැරි තරමට වෙනස් වෙලා.. ඉස්සර සමාජ ප්‍රගමණය වෙනුවෙන් ජීවිතේ හරි දෙන්න ලෑස්ති වෙලා හිටිය ප්‍රගතිශීලී මිනිස්සු පවා දැන් තම තමන්ගෙ ගුහා වලට වැදිලා දොරවල් වහගෙන හැංගිලා තමයි ඉන්නෙ.. තමන්ගෙ පාදුවේ තම තමන්ගෙ ව්‍යාපෘති කරගෙන ඉන්නවා මිසක් මේවගේ දේවලට අත දාන්න ඒ අය කැමති නැහැ.. මට තේරෙන්නෙ නැහැ ඒ මොකද කියලා.. ඒක ආත්මාර්ථය නිසා කරන දෙයක් කියලා හිතන්නත් මං කැමති නැහැ.."

"ස්වයං ආරක්ෂාව... ඒක තමයි ඒකට හොඳම වචනෙ.. කවුරුත් එන්නෙ නැහැ වෙනත් අය බේරගන්න.. ඒ නිසා තම තමන්ම ස්වයං ආරක්ෂාවක් දා ගන්නවා.. "

"බයගුල්ලො.." විදුල මිමිණුවේ ය.

"එහෙම කියන්න එපා සර්.. ඒ තරම් සරළ විදියට ඒක අර්ථ දක්වන්න යන්න එපා.. අපේ පැත්තෙන් අපට වැරදියි කියලා පේන දේ ඒ මිනිස්සුන්ගෙ පැත්තෙන් හරි කියලා පේනවා ඇති.. ඒක වරදක් නෙවෙයි.." මදාරා කීවා ය. විදුල කිසිවක් නොකියා සිනාසුණේ ය. ".. ඉතින් දැන් සර් මොකද කරන්න යන්නෙ..?"

"මොකක් ගැන ද..?"

"ස්ක්‍රිප්ට් එක ගැන... ෆිල්ම් එක ගැන.."

"මේක කොහොම හරි කරන්න ඕනෙ මදාරා.. දැං මට ඉතිරි වෙලා තියෙන්නෙ එකම එක ක්‍රමයයි.. මට වෙන කරන්න දෙයක් නැහැ.. මං ඒක කරනවා.." විදුලගේ කටහඬෙහි ඇත්තේ පරාජිත බවක් යයි මදාරාට සිතුණි. එය ඇගේ සිතේ ඇති කළේ කණගාටුවකි.

"සර් මොකද්ද කරන්න යන්නෙ..?"

විදුල ඇගේ පැනයට පිළිතුරු දිය යුතු යයි නොසිතුවේ ය. මේ කතාව වෙනතකට හැරවිය යුතු ය. ".. ආදිවාසී සාකච්ඡාවට කවද්ද ඔයා නුවර යන්නෙ..?" ඔහු ඇසුවේ ය.

"මිස්ටර් ජයසේකර ඒක ඕගනයිස් කරමින් ඉන්නෙ.. එයා හෙට මට කියනවා කිව්වා ස්ථිරවම.. සර් එනවා නේද..?" මදාරා ඇසුවා ය.

විදුල සිනාසුණේ ය.

"මං එනවා කියලා පෙරොන්දු වුණා කියලයි මට මතක.." ඔහු මෝටර් රථය පනගන්වමින අතර කීවේ ය. මදාරා ආසනයේ පසුපසට ඇදී ඔහු දෙස හිස හරවා බැලුවාය.

"මං හිතුවා අමතක වෙලා ඇතියි කියලා.."

"මට ලේසියෙන් යමක් අමතක වෙන්නෙ නැහැ මදාරා.."

ළබන කළාපයට